# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
(බාහිර) - 2007

බෞද්ධ සංස්කෘතිය - BUCU-E1015

භාරතීය සංස්කෘතික පසුබිම හා බෞද්ධ සංස්කෘතියේ මූලධර්ම

<u>ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි

කාලය : පැය 03 යි

---

01. වෛදික බහුදේවවාදය හඳුන්වා දෙමින් එය සොබාදහමත් සමඟ පැවති සබඳතාව විමසුමට ලක් කරන්න.

02. බ්‍රාහ්මණ වර්ණ ධර්ම හා ස්වධර්ම සංකල්පය තුළින් මතු වූ සමකාලීන සමාජ ගැටළු කවරේදැයි පරීක්ෂා කරන්න.

03. කාන්තාව පිළිබඳ වෛදික මතය පැහැදිලි කරමින් එය ඇගේ අයිතියට හා නිදහසට ඇතිකළ බලපෑම කෙබඳුදැයි සාකච්ඡා කරන්න.

04. කර්මය හා විපාකය පිළිබඳ ෂට් ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් අදාළ මූලාශ්‍රය ඇසුරින් සමාලෝචනය කරන්න.

05. බුද්ධකාලීනව පැවති අත්තකිලමථානුයෝගී ශ්‍රමණ ව්‍රත හඳුන්වා දෙමින් ඒවායෙහි අරමුණු හා ස්වභාවය විමර්ශනය කරන්න.

06. බෞද්ධ ශීල ශික්ෂාව සමාජයේ සාමකාමී සහජීවනය පිණිස වෙසෙසින්ම උපකාරීවන අයුරු පඤ්ච ශීල ප්‍රතිපදාව ආශ්‍රයෙන් පෙන්වා දෙන්න.

07. චිත්ත සමාධිය පුද්ගල චරිතසංවර්ධනයේ අඩිතාලම වන ආකාරය බුද්ධවචනය අනුසාරයෙන් පරීක්ෂා කරන්න.

08. ආත්මවාදය සැකෙවින් හඳුන්වා, බෞද්ධ අනාත්ම චින්තනය තුළින් ආත්මාර්ථකාමීත්වය පිටුදකින ආකාරය පැහැදිලි කරන්න.

09. "සිතීමේ හා විමැසීමේ නිදහස පිළිබඳ ඉගැන්වීම් බෞද්ධ සංස්කෘතියේ විශිෂ්ඨත්වය හා සුවිශේෂත්වය පිළිබිඹු කරයි." විමසන්න.

10. බුදු සමය ව්‍රත සමාදානය අනුමත නොකරන්නේ කවර කරුණු අනුවදැයි අදාළ සූත්‍රාන්තයන් ඇසුරින් විභාග කරන්න.

***************************